# ධර්මදූත විද්‍යාලය - බදුල්ල
## ප්‍රථම වාර පරීක්ෂණය - 2017
## ඉතිහාසය.

7 ශ්‍රේණිය — කාලය -: පැය 02යි.

**1 කොටස**

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) ශ්‍රී ලංකාවේ පුරාණ ජීවවන රටාව ප්‍රධාන ක්ෂේත්‍ර කීයක් යටතේ සිදු වී ඇති බව පෙනේද?
1. 2ක් 11. 3ක් 111. 4ක් 1V. 6ක්

(2) ලෝකයේ පැරණිම ගොවිතැන් ක්‍රමය ලෙස හඳුන්වන්නේ,
1. මඩ ගොවිතැන 11. කුඹුරු 111. හේන් ගොවිතැන 1V. කෘෂිකර්මාන්තය

(3) පුරාණ සෙල්ලිපි වල " පිටබිම " යනුවෙන් හඳුන්වා ඇත්තේ,
1. කුඹුරුය. 11. කමත්ය. 111. හේන්ය. 1V. කාර්මික බිම්ය.

(4) තෝනිගල ශිලා ලිපියේ " අකලහස " යනුවෙන් හඳුන්වා ඇත්තේ,
1. මහ කන්නය. 11. මැද කන්නය. 111. නව දැලි හේන 1V. යල කන්නය

(5) අතීත ලංකාවේ වෙළඳාම දියුණු වීමත් සමඟම බිහිවූ වෙළඳ නගරයක් වන්නේ ,
1. පුලතිසිපුර 11. පරාක්‍රමපුර 111. මාගම 1V. තම්බපණ්ණිය

(6) සාලිය කුමාරයාගේ බිසව වූ අශෝක මාලා රසවත් ලෙස ආහාර පිළියෙල කළ බව සඳහන් වන්නේ,
1. සද්ධර්මාලංකාරයේය. 11. සහස්සවත්ථුපකරණයේය.
111. මහා වංශයේය. 1V. රසවාහිනීයේය.

(7) අතීත ජනයා වී පරිහරණයට ගන්නා තෙක් ආරක්ෂා සහිතව තැන්පත් කර ඇති ස්ථානය ,
1. කුඹුරේ 11. හේන් වල 111. වී බිස්සවල 1V. අටු වලය.

(8) පණ්ඩුකාභාය රජතුමාගෙන් පසු අනුරාධපුරයේ රජු බවට පත් වූයේ,
1. දේවානම්පියතිස්සය. 11. සද්ධාතිස්සය.
111. මූටසීවය. 1V. මානවම්මය.

(9) ඉංදියවේ පල්ලව රාජායේ සහයෙන් ක්‍රි.ව. 684 දී මෙරට රාජාත්වයට පත් රජතුමා කවුද?
1. වසබ රජතුමා ය. 11. මානවම්ම රජතුමා ය.
111.දෙවන දාඨෝපතිස්ස රජතුමා ය. 1V. දෙවන කස්සප රජතුමා ය.

(10) පළමු සේන රජතුමාගේ පාලනය සමයේ මුල් භාගයේ මෙරට ආක්‍රමණය කරන ලද්දේ ,

1. ශ්‍රී මාර ශ්‍රී වල්ලභ රජුය.

11. දෙවන නරසිංහ වර්මන් රජතුමාය.

111. දෙවන වරගුණවර්මන් රජතුමාය

1V. කුට්ඨක සෙනවියා.

- පහත දැක්වෙන ප්‍රකාශ හරි නම් (√ ) ලකුණ ද වැරදිනම් වැරදි ලකුණ ද ( x ) ද හිස්තැනෙහි යොදන්න.

(11) ශ්‍රී ලංකාව “ රත්නදීප ” යනුවෙන් අතීතයේ දී හඳුන්වා ඇත්තේ අප රට මැණික් වලට ප්‍රසිද්ධ ව තිබූ නිසාය. ( )

(12) බදුළු ටැම් ලිපිය කරවන ලද්දේ මහසෙන් රජතුමාය. ( )

(13) සාමාන්‍ය ජනතාව පමණක් නොව අතීත රජවරු ද ගොවිතැන් කටයුතු වලට සම්බන්ධ වූ බව මූලාශ්‍ර වල සඳහන් වේ. ( )

(14) අධිෂ්ඨානශීලී ව ඉවසීලිවන්ත ව කටයුතු කිරීමෙන් තම අරමුණු ජය ගත හැකි බව මානවම්ම රජතුමාගේ චරිතයෙන් පෙනේ, ( )

(15) වර්තමාන සමාජයට අතීත සමාජයෙන් මහඟු ආදර්ශ ලබා දෙයි. ( )

- හිස්තැනට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(16) මහා වංශයේ සඳහන් වන පරිදී ........................................................... (පණ්ඩුකාභය රජතුමා / දුටුගැමුණු රජතුමා ) ළමා කාලය ගත කර ඇත්තේ ගොපලු ගමකය.

(17) ......................................... ( මාතොට / මාගම ) අතීතයේ පැවති දියුණු වෙළඳ නගරයකි.

(18) ශ්‍රී ලංකාවට අයත් තට්ටු හා පඩි පේළි වලින් ශක්තිමත් නැව් ......................................( චීනයේ / රෝමයේ) වරායවල තිබූ බව එම රටේ මූලාශ්‍ර වල සඳහන් වේ.

(19) දියණිවරුන් සූප ශාස්ත්‍රයෙන් දක්ෂයන් කිරිම දෙමාපියන්ගේ වගකීමක් බව............................................................( සද්ධර්මාලංකාරයේ / සහස්සවත්ථුපකරයේ ) සඳහන් වේ.

(20) .........................................( භානිකාභය / පණ්ඩුකාභය ) රාජ්‍ය අවධියේ මළ සිරුර ගෙන යාමට සෙහොන් පල්ලන් 150ක් වෙන්කර සිටි බව මහාවංශයේ සඳහන් වේ.

( ලකුණු 20x2=40)

## 11 කොටස

(1) පහත දැක්වෙන පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



A



B

1) 1. ඉහත Aරූපයේ දැක්වෙන කාසියේ නම කුමක්ද?
 11. එය සොයා ගෙන ඇත්තේ කුමන ප්‍රදේශයකින්ද?
 111.මෙය අයත් වන සියවස නම් කරන්න.

2) 1. B රූපයේ දැක්වෙන උපකරණ කුමක්ද?
 11. එය භාවිතා කලේ කුමන කර්මාන්තයක් සඳහාද?
 111. මෙම කර්මාන්තයේ යෙදුන ශිල්පින් හැඳින්වූයේ කෙසේද?

3) 1. පහත දැක්වෙන ස්ථාන සපයා ඇති ලංකා සිතියමේ ලකුණු කර නම් කරන්න.

* මාතොට
* අනුරාධපුරය
* මාගම
* පොළොන්නරුව
* ගෝකණ්ණ
* බදුල්ල
* ගොඩවාය
* හම්බන්තොට
* මහියංගනය
* මිහින්තලේ

( ලකුණු 10යි)

(2) 1. අතීතයේ මෙරට කෘෂිකර්මාන්තය ප්‍රධාන අංග 2ක් යටතේ සිදු විය. එම අංශ දෙක නම් කරන්න.
 11. හේනක් සකස් කිරීමේ සිට අස්වැන්න නෙළා ගැනීම දක්වා ගොවියා සිදු කළ කාර්යයන් කීපයකි. ඉන් දෙකක් සඳහන් කරන්න.
 111. " නව දැලි හේනක් " යනු කුමක්ද? ( ලකුණු 10යි)

(3) පහත දැක්වෙන්නේ අතීතයේ මෙරට පැවති කෘෂිකර්මාන්ත වර්ග 03කි.

A. ලෝහ  B. මැටි  C. මැණික්

1. ඉහත කර්මාන්ත ආශ්‍රිතව වැඩ කළ ශිල්පින් හැඳින්වූ ශිල්පීයනාමය ලියා දක්වන්න.
11. ඉහත කර්මාන්ත ආශ්‍රිතව නිෂ්පාදන භාණ්ඩ වර්ග 03ක් නම් කරන්න.
111. අතීතයේ ලංකාවේ පැවති වෙළඳපල දෙයාකාර වේ. එය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10යි.)

(4) 1. අනුරාධපුර යුගයේ මෙරට වැඩිම කාලයක් පාලන බලය දැරූ පෙළපත් 02ක් නම් කරන්න.

11. මානවම්ම පරපුරට අයත් රජවරු දෙදෙනෙක් නම් කරන්න.

111. මානවම්ම චරිතයෙන් ගත හැකි ආදර්ශ පෙන්වා දෙමින් ඔවුන්ගේ පාලනය කාලයේ කැපි පෙනෙන ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

(5) 1. මඩ ගොවිතැන යනු කුමක්ද?

11. " අතීතයේ පැවති සීසෑමේ ක්‍රම පරිසරයට අහිතකර නොවීය"කෙටියෙන් පැහැදිලි කරන්න.

111. ගොවිතැන්හිදි භාවිතා කළ පහත වචන වල අර්ථය පැහැදිලි කරන්න.

*ගොයම් මැඩීම *ගොයම් කොළය *කමත

(ලකුණු 10යි)

(6) 1." සංස්කෘතිය" යන්න කෙටියෙන් අර්ථ දක්වන්න.

11." අතත්තම් ක්‍රමය " යනුවෙන් කුමක් අදහස් කළේද?

111.දෙමාපියන්ට සැළකූ ආකාරය අතීත රජවරු තුළින්ද පැහැදිලි වේ.අනුරාධපුර රාජධානී යුගයේ ඒ පිළිබද සඳහන් වන රජතුමා කවුරුන්ද? ඒ පිළිබද කෙටියෙන් විස්තර කරන්න.

( ලකුණු 10යි)

(7) 1. දෙවන සේන රජතුමා යුවරජ තනතුර දැරුවේ කුමන රජු යටතේද?

11. දෙවන සේන රජතුමාගෙන් සිදු වූ මහජන සුභ සිද්ධි සේවා මොනවාද?

111.පාණ්ඩ්‍ය රාජ්‍ය ආක්‍රමණය කිරීමට දෙවන සේන රජතුමාට උදවු කළ සෙනවියා කවුරුන්ද? ඔහු පිළිබද සඳහන් වන සෙල් ලිපිය කුමක්ද? (ලකුණු 10යි)